**72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව**
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

## මාධ්‍ය ප්‍රකාශය

**නිකුත් කිරීම**

දිනය: 2023 අප්‍රේල් 20
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් පෙ.ව. 12:01

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රින් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at’ ihp.lk

**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at’ ihp.lk ට්විටර්: @ravirannaneliya


# අනාගත ජනාධිපතිවරණයකදී අනුර කුමාර දිසානායක (48%) සජිත් ප්‍රේමදාස (37%) අභිබවමින් පෙරමුණ ගනියි.

*2023 මාර්තු IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම.*

IHP ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේ (SLOTS) MRP ජනාධිපතිවරණ ඡන්ද ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු ප්‍රතිඵලවල පළමු නිකුතුවේදී, 2023 මාර්තු මාසයේදී අපේක්ෂිත ඡන්දදායකයින්ගෙන් 48%ක් ලබාගත් ජා.ජ.බ./ජ.වි.පෙ. නායක අනුර කුමාර දිසානායක, 37% ක් ලබාගත් ස.ජ.බ. නායක සජිත් ප්‍රේමදාසට වඩා ඉදිරියෙන් සිටියි. මොවුන් දෙදෙනාම, 11%ක් ලබාගත් ජනාධිපති රනිල් වික්‍රමසිංහට සහ 4%ක් ලබාගත් ශ්‍රී.ල.පො.පෙ. අපේක්ෂකයාට වඩා බොහෝ ඉදිරියෙන් සිටිති. ඇස්තමේන්තු 1-5% ක දෝෂ ආන්තිකය සමඟ තක්සේරු කර ඇත.

**ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, 2023 මාර්තු (අපේක්ෂිත ඡන්දදායකයින් %)**

අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**


2023 මාර්තු මාසයේ පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 521ක් සහ 2021 අගෝස්තු 31 සිට 2023 අප්‍රියෙල් 9 දක්වා සිදු කරන ලද සම්මුඛ පරීක්ෂණ 10,601 මත පදනම්ව ඇස්තමේන්තු සකස් කර ඇත. ඇස්තමේන්තු MRP ආකෘතියකින් ව්‍යුත්පන්න කර ඇති අතර 1-5% ක දෝෂ ආන්තිකයක් සමග තක්සේරු කර ඇත. ආරම්භයේදී ශ්‍රී.ල.පො.පෙ සඳහා 'ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ' සඳහා ලැබු මනාප යොදා ගෙන ඇති අතර පසුව එය ශ්‍රී.ල.පො.පෙ පක්ෂ අපේක්ෂකයෙකු ලෙස විමසන ලදී.

IHP INSTITUTE FOR HEALTH POLICY

වාර්තා වී ඇති අපේක්ෂිත ඡන්ද මත පදනම්ව, මාර්තු මාසයේ දී ජනාධිපතිවරණයක් පැවැත්වුවහොත් අනුර කුමාර දිසානායක මහතා බොහෝ දුරට ජයග්‍රහණය කිරීමට ඉඩ තිබේ. ජනාධිපතිවරණයකින් ජයග්‍රහණය කිරීමට අවශ්‍ය අවම ප්‍රතිශතය වන 50% සීමාවට වඩා ඔහුට අඩු සහයක් පැවතියද, රනිල් වික්‍රමසිංහ සහ ශ්‍රී.ල.පො.පෙ. ඡන්දදායකයින්ගේ දෙවන මනාප ඔහුව ඉහළින් තැබීමට ප්‍රමාණවත් වනු ඇත.

**IHP SLOTS ජනාධිපතිවරණ ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය, (අපේක්ෂිත ඡන්දදායකයින් %)**

අද ජනාධිපතිවරණයක් පැවතුණි නම්, ඔබ ඡන්දය ලබා දෙන්නේ කාටද?




**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණය MRP**

2021 අගෝස්තු 31 සිට 2023 අප්‍රියෙල් 9 දක්වා පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ 10,601 මත මාසික ඇස්තමේන්තු පදනම් වේ. ඇස්තමේන්තු MRP ආකෘතියකින් ව්‍යුත්පන්න කර ඇති අතර මාසය සහ පක්ෂය අනුව 1-7% ක දෝෂ ආන්තිකයක් සමග තක්සේරු කර ඇත. ආරම්භයේදී ශ්‍රී.ල.පො.පෙ සඳහා 'ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ' සඳහා ලැබු මනාප යොදා ගෙන ඇති අතර පසුව එය ශ්‍රී.ල.පො.පෙ පක්ෂ අපේක්ෂකයෙකු ලෙස විමසන ලදී.

IHP INSTITUTE FOR HEALTH POLICY

2022 මැද භාගයේ දී රනිල් වික්‍රමසිංහ ජනාධිපති ලෙස පත්වු පසුව ඔහුට ජනාධිපතිවරණයකදී අපේක්ෂිත සහායේ වැඩි වීමක් පෙන්වන ලදී. නමුත් ඔහු ජනාධිපති ලෙස පත්වීමේ උණුසුම පහව යන්නටත් මත්තෙන් 2023 මුල් භාගය වන විටදීම ඔහුට තිබූ සහය අඩු විය. කෙසේ වෙතත්, මාර්තු මාසයේ පැවති නවතම ඡන්දමත විමසීමේදී, ඔහුට 3%ක වැඩිවීමක් පෙන්නුම් කර ඇති අතර, ප්‍රධාන නායකයින් දෙදෙනාට වඩා අවම ප්‍රතිශතයක තිබුවද, මෙමගින් වික්‍රමසිංහයන්ට අපේක්ෂිත සහායේ වැඩි වීමක් ඉදිරියේදී දැකිය හැකි බව යෝජනා කරයි.

SLOTS මත විමසීමේදී ප්‍රතිචාර දක්වන්නන්ට, අපේක්ෂකයින් හතර දෙනෙකුගේ නාමයන් පමණක් ඉදිරිපත් කරනු ඇත. SLOTS ප්‍රධාන විමර්ශක සහ IHP විධායක අධ්‍යක්ෂ ආචාර්ය රන්නන්-එලිය මහතා අදහස් දක්වමින් කියා සිටියේ "නව අපේක්ෂකයන් හෝ පක්ෂ කිහිපයක එකතුවෙන් ගොඩනඟන ලද සන්ධානයක් ඉදිරිපත් වුවහොත් මෙම ප්‍රතිඵල බොහෝදුරට වෙනස් වීමට ඉඩ ඇති බවයි". ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන්නේ " ස.ජ.බ. ඡන්දදායකයින්ගේ අදහස් ශ්‍රී.ල.පො.පෙ. සහ එ.ජා.ප. ඡන්දදායකයින්ට වඩා ජා.ජ.බ./ජ.වි.පෙ. වෙත සමීප වේ, ශ්‍රී.ල.පො.පෙ.- එ.ජා.ප. සන්ධානයට වඩා වැඩි ඡන්ද ප්‍රමාණයක් ස.ජ.බ.- එ.ජා.ප. සන්ධානයට ලබා ගත හැකි බැවින් ජා.ජ.බ./ජ.වි.පෙ. සඳහා බොහෝ ඡන්ද දායකයින් අහිමි වීමටද ඉඩ ඇති බවයි".

**සම්පූර්ණ වාර්තාව**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, "2023 මාර්තු IHP ජනාධිපතිවරණ ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම: අනාගත ජනාධිපතිවරණයකදී අනුර කුමාර දිසානායක (48%) සජිත් ප්‍රේමදාස (37%) අභිබවමින් පෙරමුණ ගනියි.", *https://www.ihp.lk/publications/docs/SLOTSReport202309.pdf* යෙන් ලබා ගත හැකිය.

**අදාළ වාර්තා**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, "2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු: ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.", SLOTS වාර්තාව #2023-06. *http://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf* යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, "සියලුම දේශපාලන පක්ෂ නායකයින් කෙරෙහි ශ්‍රී ලාංකිකයන් දිගින් දිගටම අහිතකර මතයක් දරයි." *https://www.ihp.lk/publications/docs/SLOTSReport202307.pdf* යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 මාර්තු MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 521ක් සහ 2021 අගෝස්තු 31 සිට 2023 අප්‍රියෙල් 9 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 10,601ක් මත පදනම් වන අතර අනුර කුමාර දිසානායක සහ සජිත් ප්‍රේමදාස සඳහා 4-5%ක සහ අනෙකුත් ප්‍රධාන අපේක්ෂකයින් දෙදෙනා සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019 ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.